සැ. යු. - 2010.06.11 දින පළ වූ අංක 1,658 දරන ගැසට් පත්‍රයේ I-III,II සහ III කොටස් පළ නොවීය.
මෙවර පළවන ගැසට් පත්‍රයේ VI කොටසේ 2009 වර්ෂයේ පශු වෛද්‍ය නිලධාරීන්ගේ නාමලේඛනයක් ඉංග්‍රීසි භාෂාවෙන් පළවේ.
මෙම ගැසට් පත්‍රයේ දෙමළ අනුවාදනය වෙනම මුද්‍රණය කෙරේ.

# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

අංක 1,659 - 2010 ජූනි මස 18 වැනි සිකුරාදා - 2010.06.18

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# IV (ආ) වැනි කොටස - පළාත් පාලනය

(වෙන වෙනම ගොනු කර ගත හැකි පරිදි සෑම කොටසකට ම අයත් එක් එක් භාෂාවකට වෙන වෙනම පිටු අංක යොදා ඇත )

| | පිටුව |
|---|---|
| තනතුරු-ඇබෑර්තු ... ... ... ... | 1228 |
| විභාග, විභාග ප්‍රතිඵල ආදිය ... ... ... ... | — |
| පළාත් පාලන නිවේදන ... ... ... ... | 1234 |
| අතුරු ව්‍යවස්ථා ... ... ... ... | — |
| පළාත් පාලන සහා ඡන්ද ආඥාපනත යටතේ දැන්වීම ... | — |
| ආදායම් හා වියදම් පිළිබඳ ප්‍රකාශන ... ... ... | — |
| අයවැය ලේඛන ... ... ... | — |
| දේපළ විකිණීම් ... ... ... | — |
| විවිධ දැන්වීම් ... ... ... | 1236 |

**සතිපතා නිකුත් වන ගැසට් පත්‍රයෙහි පළකිරීම සඳහා භාරගනු ලබන දැන්වීම් පිළිබඳ**

## වැදගත් නිවේදනයයි

ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* අවසන් පිටුවේ සෑම මාසයකම මුල් සතියේ දී පළ කරන නිවේදන භාරගන්නා දිනයන් සහ වේලාවන් පිළිබඳව මින් අවධානය යොමු කරනු ලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කිරීම සඳහා දැන්වීම් භාරගැනීම *ගැසට් පත්‍රය* පළකරනු ලබන දිනයට සති දෙකකට පෙර සිකුරාදා දිනයෙහි දහවල් 12.00 ට අවසන් කරනු ලැබේ. තනතුරු - ඇබෑර්තු, විභාග, ටෙන්ඩර් සහ වෙන්දේසි පිළිබඳ දැන්වීම්වල අවසන් දින සහ වේලාවන් ඒ පිළිබඳව උනන්දුවක් දක්වන අයට ප්‍රමාණවත් කාල වේලාවක් ලැබෙන පරිදි යොදාගත යුතු බවට, සියලුම දෙපාර්තමේන්තු, සංස්ථා සහ මණ්ඩල යනාදිය වගබලාගත යුතු බව මින් අවධාරණය කෙරේ. පළකිරීම සඳහා එවනු ලබන සෑම දැන්වීමක් ම තනි පැත්තේ පමණක් පැහැදිලිව පිටපත් කළ යුතුය. නිරවද්‍යතාවය පිළිබඳව කරන විමසීම් සහ පැමිණිලි *ගැසට් පත්‍රය* පළ වූ දින සිට තෙමසකට පසුව භාරගනු නොලැබේ.

*ගැසට් පත්‍රයේ* පළ කරන සෑම දැන්වීමක් ම *ගැසට් පත්‍රය* පළ කරනු ලබන දිනට සති දෙකකට පෙර එනම්, 2010 ජූනි මස 24 වැනි දින පළ කෙරෙන *ගැසට් පත්‍රයේ* දැන්වීම් 2010 ජූනි මස 11 වැනි දින දහවල් 12.00ට හෝ ඊට පෙර තැපෑලෙන් හෝ ගෙනවිත් රජයේ මුද්‍රණාලයට භාරදිය යුතුය.

**ලක්ෂමන් ගුණවර්ධන,**
රජයේ මුද්‍රණාලයාධිපති.

2010 ජනවාරි මස 01 වැනි දින,
රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුව,
කොළඹ 08.

# තනතුරු - ඇබෑර්තු

## මහනුවර දිස්ත්‍රික්කය - අකුරණ ප්‍රාදේශීය සභාව

මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම

මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීමට අවම සුදුසුකම් ඇති මධ්‍යම පළාත තුල පදිංචිකරුවන්ගෙන් පමණක් අයදුම්පත් කැඳවනු ලැබේ. (අකුරණ ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ පදිංචිකරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.) අයදුම්කරුවන් මෙහි පහත දක්වා ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පත්‍රය සම්පූර්ණ කර "ලේකම්, අකුරණ ප්‍රාදේශීය සභාව, අලවතුගොඩ" යන ලිපිනයට 2010 ජූලි මස 20 දිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතු ය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *වැටුප් ක්‍රමය* | *අවම සුදුසුකම්* |
|---|---|---|---|
| 01 | මාර්ග කම්කරු | PL 1- 2006A<br>රු.11,730-10x120-10x130-10x145 -12x160-රු.17,600 | දෙවරකට නොවැඩි වාර ගණනකදී අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් හෝ ජාතික අධ්‍යාපන පොදු සහතික පත්‍ර (සාමාන්‍ය පෙළ) විභාගයෙන් සිංහල හෝ දෙමළ භාෂාව සමග අවම වශයෙන් විෂයන් 06කින් සාමාර්ථය ලබා තිබිය යුතු ය. |

බඳවාගැනීම සඳහා පොදු කොන්දේසි :-

01. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
02. අයදුම්කරු මධ්‍යම පළාත තුල අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 03ක කාලයක් ස්ථිර පදිංචිකරුවෙකු විය යුතුය. (අකුරණ ප්‍රාදේශීය සභා බල සීමාවේ පදිංචිකරුවන්ට විශේෂ සැලකිල්ලක් දක්වනු ලැබේ.)
03. අයදුම්පත්‍ර භාරගන්නා දිනට අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
04. අයදුම්කරු විශිෂ්ඨ චරිතයකින් හා මනා සෞඛ්‍ය තත්වයකින් සිටිය යුතුය.
05. අකුරණ ප්‍රාදේශීය සභාවේ දැනට තාවකාලික, අනියම්, ආදේශක, කොන්ත්‍රාත් පදනම මත සේවය කරනු ලබන හා පුහුණුවන සේවකයන් කෙරෙහි වැඩි අවධානයක් යොමු කරනු ලැබේ.
06. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේ දී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම අකුරණ ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

01. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
02. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත් වේ.
03. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසි වලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට, මුදල් රෙගුලාසි වලට රජයේ දෙපාර්තමේන්තු නියෝග වලට ද මධ්‍ය පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාවේ හා අකුරණ ප්‍රාදේශීය සභාව විසින් වරින් වර නිකුත් කරන රෙගුලාසි හා නියෝග වලට ද, අනුකූලව බැඳී සිටිය යුතුය.
04. වැන්දඹු/වැන්දඹු පුරුෂ හා අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක විය යුතුය.

*(ඇ) අයදුම්කළ යුතු ආකාරය :*

මෙම නිවේදනය අවසානයේ ඇති ආදර්ශ ආකෘතිය පරිදි අඟල් 12x 8 ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර "මාර්ග කම්කරු තනතුර "යනුවෙන් අදාල කවරයේ වම්පස ඉහළ කෙලවරේ ලියා 2010 ජූලි මස 20 වැනි දිනට පෙර ලේකම්, අකුරණ ප්‍රාදේශීය සභාව, අලවතුගොඩ යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් පළාත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දින පසුවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල පිටපත් එවිය යුතුය. :-

01. උප්පැන්න සහතිකය.
02. අධ්‍යාපන සහතික.
03. පදිංචිය සනාථ කිරීමේ සහතිකය.

04. මෑතකදී ලබාගත් ග්‍රාමසේවක සහතිකය
05. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්
06. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතිකපත්
07. සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය.

සී. අයි. අමදෝරු,
ලේකම්,
අකුරණ ප්‍රාදේශීය සභාව,
අලවතුගොඩ.

2010 මැයි මස 24 වැනි දින,
මහනුවර දිස්ත්‍රික්කයේ අකුරණ ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

***මහනුවර දිස්ත්‍රික්කය - අකුරණ ප්‍රාදේශීය සභාව***

*මාර්ග කම්කරු තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. *(අ)* මුලකුරු සමග නම :————.
*(ආ)* සම්පූර්ණ නම :————.
02. ලිපිනය :————.
03. ජාතික හැඳුනුම්පත් අංකය :————.
04. උපන් දිනය : අවුරුද්ද:————. මාසය :————. දිනය :————.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :————.
06. විවාහක බව/ අවිවාහකබව : ————.
07. ජාතිය :————.
08. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? යන වග :————.
09. අධ්‍යාපන සුදුසුකම්:————.
10. වෘත්තීය සුදුසුකම් හා පළපුරුද්ද :————.
10. ඔබ දැනටමත් මෙම ප්‍රාදේශීය සභාවේ සේවය කරන්නේ නම් සේවා කාලය, විස්තරය හා පත්වීමේ ස්වභාවය :————.

මෙම ඉල්ලුම්පත්‍රයේ මා විසින් සපයන ලද තොරතුරු සත්‍ය වූත් නිවැරදි වූත් බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය බව මා මෙම තනතුරට තෝරා පත්කර ගැනීමට පෙර අනාවරණය වුවහොත් මා නුසුදුස්සෙකු වන බවට පත්වන බවත් තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් දනිමි.

————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :————.

06-338

---

**පූජාපිටිය ප්‍රාදේශීය සභාව**

**මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පුරප්පාඩු පිරවීම**

පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ දැනට පුරප්පාඩු වී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුර සඳහා බඳවා ගැනීම පිණිස නියමිත සුදුසුකම් ඇති මධ්‍යම පළාත තුළ ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

අයදුම්කරුවන් මෙහි පහත දැක්වෙන ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගන්නා ලද අයදුම්පතක් සම්පූර්ණ කර ලේකම්, පූජාපිටිය ප්‍රාදේශීය සභාව, පූජාපිටිය යන ලිපිනයට 2010.07.15 දිනට හෝ එදිනට පෙර ලැබෙන සේ ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය.

| *අනු අංකය* | *තනතුරු නාමය* | *තනතුරු සංඛ්‍යාව* | *වැටුප් කාණ්ඩය සංඛ්‍යාව හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෙනත් සුදුසුකම්* |
|---|---|---|---|---|---|
| 01 | බැකෝ ලෝඩර් ක්‍රියාකරු | 01 | PL -3 (06/2006 IV) රු.12,470-130x10-145x10-160x10 -170x12-රු.18,860 | අවම වශයෙන් 8 ශ්‍රේණිය සමත් වී තිබීම | තාර බර හොණ්ඩර 34ට වැඩි මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 30කට වඩා ගෙනයා හැකි |

| *අනු. අංකය* | *තනතුරු නාමය* | *තනතුරු* | *වැටුප් කාණ්ඩය සංඛ්‍යාව හා වැටුප් පරිමාණය* | *අධ්‍යාපන සුදුසුකම්* | *වෙනත්* |
|---|---|---|---|---|---|
| | | | | | බලපත්‍ර ලබා ඇති බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණතා පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුයි. (ඒ පන්තිය)<br><br>බැකෝ යන්ත්‍ර ක්‍රියාකරු වශයෙන් වසර තුනක පළපුරුද්දක් ලබා තිබිය යුතුයි.<br><br>අවම උස අඩි 5ක් විය යුතුය. |

බඳවාගැනීම සඳහා පොදු කොන්දේසි :-

i. අයදුම්කරු ශ්‍රී ලංකාවේ පුරවැසියෙකු විය යුතුය.
ii. අයදුම්කරු මධ්‍යම පළාත තුළ 2010.07.15 දිනට පූර්වාසන්න වසර 03කට නොඅඩු කාලයක් ස්ථිර පදිංචි කරුවෙකු විය යුතුය.
iii. අයදුම්පත්‍ර භාරගන්නා දිනට අවුරුදු 18 නොඅඩු හා අවුරුදු 45ට නොවැඩි විය යුතුය. (රජයේ හෝ පළාත් රාජ්‍ය සේවයේ ස්ථිර සේවකයෙකු සම්බන්ධයෙන් උපරිම වයස් සීමාව බලපානු නොලැබේ.)
iv. අයදුම්කරු මනා සෞඛ්‍ය තත්වයෙන් සිටිය යුතුය.
v. සේවා අවශ්‍යතාවය අනුව විධිමත් සම්මුඛ පරීක්ෂණයක් හා අවශ්‍යතාවය පරිදි ප්‍රායෝගික පරීක්ෂණ මගින් සුදුස්සන් තෝරනු ලැබේ.
vi. අයදුම්පත් කැඳවීමෙන් පසු හෝ කැඳවන අතරතුර කාල සීමාවේදී හෝ මෙම බඳවා ගැනීම ප්‍රමාද කිරීම හෝ වෙනස් කිරීම හෝ මෙම *ගැසට්* නිවේදනය අවලංගු කිරීම හෝ සංශෝධනය කිරීම පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුය.

*සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි :*

i. මෙම තනතුර ස්ථිර හා විශ්‍රාම වැටුප් සහිතය.
ii. පත්වීම අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වේ.
iii. මෙම බඳවා ගැනීමේ කොන්දේසි හා රෙගුලාසිවලට අමතරව ශ්‍රී ලංකා ආයතන සංග්‍රහයේ රෙගුලාසිවලට මුදල් රෙගුලාසිවලට රජයේ දෙපාර්තමේන්තු නියෝගවලට ද මධ්‍යම පළාත් රාජ්‍ය සේවා කොමිෂන් සභාව හෝ පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ ලේකම් විසින් වරින්වර නිකුත් කරන රෙගුලාසි හා නියෝගවලට ද අනුකූලව කටයුතු කිරීමට බැඳී සිටිය යුතුය.

අයදුම්කළ යුතු ආකාරය :-

මෙම නිවේදනයේ ආදර්ශ ආකෘතිය පරිදි 12"x 8" ප්‍රමාණයේ අයදුම්පතක් සකස් කර අයදුම්කරන තනතුර අදාළ කවරයේ වම්පස ඉහළ කෙළවරේ ලියා 2010 ජූලි 15 වැනි දිනට පෙර ලේකම්, පූජාපිටිය ප්‍රාදේශීය සභාව, පූජාපිටිය යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. (දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් තම ඉල්ලුම්පත් සේවා ප්‍රධානියා මගින් එවිය යුතුය.) නියමිත දින පසුවී ලැබෙන අයදුම්පත් ප්‍රතික්ෂේප කරනු ලැබේ.

අයදුම්පත් සමග පහත සඳහන් ලියකියවිලිවල සහතික කළ පිටපත් එවිය යුතුය. :-

01. උප්පැන්න සහතිකය
02. අධ්‍යාපන සහතික
03. පදිංචිය සනාථ කිරීමේ සහතිකය
04. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතිකය
05. මෑතකදී ලබාගත් චරිත සහතික දෙකක්
06. වෙනත් සුදුසුකම් දැක්වෙන සහතිකපත්
07. සේවා පළපුරුද්ද පිළිබඳ සහතිකය.

ලේකම්,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව,

2010 මැයි මස 15 වැනි දින,
පූජාපිටිය ප්‍රාදේශීය සභාව.
පූජාපිටිය.

**ආදර්ශ අයදුම් පත්‍රය**

*පූජාපිටිය ප්‍රාදේශීය සභාව*

*මධ්‍යම පළාත් රාජ්‍ය සේවයේ පූජාපිටිය ප්‍රාදේශීය සභාවේ ...................................... තනතුර සඳහා අයදුම්පත්‍රය*

01. *(අ)* මුලකුරු සමග නම :———.
*(ආ)* මුලකුරුවලින් හැඳින්වෙන නම් :———.
02. ස්ථිර පදිංචි දිස්ත්‍රික්කය :———.
03. ස්ථිර ලිපිනය :———.
04. ජාතික හැඳුනුම්පත් අංකය :———.
05. ස්ත්‍රී/පුරුෂ භාවය :———.
06. උපන් දිනය : අවුරුද්ද:———. මාසය :———. දිනය :———.
07. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස : අවුරුදු:———. මාස :———. දින :———.
ශ්‍රී ලංකා පුරවැසියෙකු වන්නේ උපතින්ද ? ලියාපදිංචි වීමෙන් ද?
08. අධ්‍යාපන සුදුසුකම් :———.
09. වෘත්තීය සුදුසුකම් (සහතික මගින් සනාථ කළ යුතුය.) :———.
10. සේවා පළපුරුද්ද :———.
11. ඔබ කවරදාක හෝ චෝදනාවක් සඳහා උසාවියකින් වරදකරුවෙකු කරනු ලැබ තිබේද ?
12. මෙහි සඳහන් කර ඇති තොරතුරු මාගේ දැනීමේ හා විශ්වාසයේ පරිදි සත්‍ය හා නිවැරදි බව ප්‍රකාශ කරමි. මෙම බඳවා ගැනීම පිළිබඳ කොන්දේසි අනුව මා විසින් සාවද්‍ය තොරතුරක් දන්වා ඇති බවට ඔප්පු වුවහොත් පත්කරනු ලැබීමට පෙර නුසුදුස්සෙකු වන බව සහ පත්වීම ලැබීමෙන් පසු සේවයෙන් පහ කරනු ලැබීමට යටත් වන බවද මම දනිමි.

———,
අයදුම්කරුගේ අත්සන

දිනය :———.

දැනටමත් රාජ්‍ය සේවයේ නියුතු අයදුම්කරුවන් සඳහා ආයතන ප්‍රධානියාගේ සහතිකය

මෙම ඉල්ලුම්කරු වන..................................... මහතා/මහත්මිය/මෙනවිය දැනට මෙම දෙපාර්තමේන්තුවේ/ආයතනයේ ................................ වශයෙන් සේවය කරයි. ඔහු/ඇය සේවයෙන් නිදහස් කළ හැක/නොහැක. ඔහු/ඇය මොනම ආකාරයේ හෝ විනයානුකූල දඬුවමකට (අවවාද කිරීම් හැර) භාජනය වී නොමැති බව සහතික කරන අතර, අයදුම්පත නිර්දේශ කර ඉදිරිපත් කරමි/නොකරමි.

———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ අත්සන

නම:———.
පදවි නාමය:———.
දෙපාර්තමේන්තු ප්‍රධානියාගේ නිල මුද්‍රාව:———.
දිනය:———.

06-362

---

**වාරියපොල ප්‍රාදේශීය සභාව**

වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ පුරප්පාඩු සඳහා බඳවා ගැනීම

වාරියපොල ප්‍රාදේශීය සභාවේ පුරප්පාඩුවී ඇති පහත උපලේඛනයේ සඳහන් තනතුරුවලට බඳවා ගැනීම සඳහා වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03කට වඩා වැඩි කාලයක් ස්ථිර පදිංචිකරුවන්ගෙන් අයදුම්පත් කැඳවනු ලැබේ.

වයඹ පළාත් ගරු ආණ්ඩුකාරතුමා විසින් 2009.05.12 දින අනුමත කරන ලද වයඹ පළාත් සභා රාජ්‍ය සේවයේ ප්‍රාථමික ශිල්පීය සේවක ගණයට සහ අර්ධ ශිල්පීය ගණයට අදාළ පුරප්පාඩු තනතුරු සඳහා බඳවා ගැනීම.

| *තනතුර* | *ශ්‍රේණිය* | *පුරප්පාඩු සංඛ්‍යාව* | *වැටුප් ක්‍රමය* |
|---|---|---|---|
| රියදුරු | III | 01 | 6/2006 (IV) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව පී.එල්. 3-2006ඒ රු.12,470-10x130-10x145-10x160 -12x170- රු.18,860 |
| නල ළිං පොම්ප කාර්මික | III | 01 | 6/2006 (IV) රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයට අනුව පී.එල්. 2-2006ඒ රු.12,210-10x130-10x145-10x160 -12x170- රු.18,660 |

*01. අධ්‍යාපන සුදුසුකම් :*

(I) අධ්‍යයන පොදු සහතික පත්‍ර සාමාන්‍ය පෙළ විභාගයේදී යටත් පිරිසෙයින් විෂයයන් 02 කට සම්මාන සහිතව විෂයයන් 06ක් වත් සමත්වී තිබිය යුතුය. (වෛකල්පිත විෂයන් හැර) අවම වශයෙන් එක් වරකදී විෂයන් 05ක් වත් සමත් විය යුතුය.

(II) *ශිල්පීය නිපුනතා.-*

තාර බර හොන්ඩර 34ට වැඩි බර මෝටර් වාහන සහ බර ට්‍රේලර් සහ මගීන් 32කට වඩා ගෙන යාමට හැකි බස් රථ පැදවීම සඳහා මෝටර් රථ ප්‍රවාහන කොමසාරිස් විසින් නිකුත් කරන ලද නිපුණත්වය පිළිබඳ සහතිකයක් ලබා තිබිය යුතුය. (ඒ පන්තියේ රියදුරු බලපත්‍රය.)

(III) *පළපුරුද්ද.-*

වාහන රියදුරකු වශයෙන් වසර 03ක පළපුරුද්දක් තිබිය යුතුය.

02. *බඳවා ගැනීමේ ක්‍රමය.-* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක සහ වෘත්තීය ප්‍රවීනතා තහවුරු කර ගැනීමේ පරීක්ෂණයක ප්‍රතිඵල මත බඳවා ගැනේ. (අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා වැඩි සැලකිල්ලක් දැක්වේ.)

03. *සේවයේ නියුක්ත කරවීමේ කොන්දේසි .-* මෙම තනතුර ස්ථිරය. විශ්‍රාම වැටුප් සහිතය. තෝරාගනු ලබන්නේ අවුරුදු 03ක පරිවාස කාලයකට යටත්වය. එම කාලය තුළ සිය රාජකාරි වැඩ, හැසිරීම හා පැමිණීම සතුටුදායක අන්දමින් පවත්වාගෙන ගොස් තිබේ නම් හා පළමුවන කාර්යක්ෂමතා කඩඉම් පරීක්ෂණය සමත් වී තිබේ නම් පරිවාස කාලය අවසානයේ දී සේවයේ/තනතුරේ ස්ථිර කරනු ලැබේ. චක්‍රලේඛ විධිවිධාන පරිදි වැන්දඹු අනත්දරු විශ්‍රාම වැටුප් අරමුදලට දායක මුදල් ගෙවිය යුතුය.

04. *නල ළිං පොම්ප කාර්මික තනතුර සඳහා අධ්‍යාපන සුදුසුකම් :*

*(අ)* බාහිර අයදුම්කරුවන් සඳහා :

අ.පො.ස. සාමාන්‍ය පෙළ විභාගයේ දී යටත් පිරිසෙයින් විෂයයන් දෙකකින් සමත්වී සිටිය යුතුය. (වෛකල්පිත විෂයයන් හැර)

*(ආ)* අභ්‍යන්තර අයදුම්කරුවන් සඳහා :

(I) පළාත් සභා රාජ්‍ය සේවයේ වාරියපොල ප්‍රාදේශීය සභාවේ ස්ථිර තනතුරක සේවයේ නියුතු ( PL-1 වැටුප් ක්‍රමය හිමි) අයදුම්කරුවන් රජය විසින් අනුමත පාසලකින් 8 ශ්‍රේණිය (9 වසර) සමත් වී තිබිය යුතුය;

(II) මෙම බඳවා ගැනීමේ පටිපාටිය වයඹ ගරු ආණ්ඩුකාරතුමා විසින් අනුමත කරන ලද දිනය වූ 2009.05.12 දිනට ප්‍රථමයෙන් වාරියපොල ප්‍රාදේශීය සභාවේ අනියම්/ආදේශක/කොන්ත්‍රාත් පදනමින් බඳවාගෙන ඇති සේවකයන්ට ද අට ශ්‍රේණිය (09 වසර) සමත්වී ඇත්නම් මේ සඳහා ඉල්ලුම් කළ හැකිය.

*පළපුරුද්ද.-* අදාළ ක්ෂේත්‍රයේ රජයේ ආයතනයක/රාජ්‍ය සංස්ථාවල සහ ව්‍යවස්ථාපිත ආයතනයක හෝ වෙනත් රජය පිළිගත් ආයතනයක යටත් පිරිසෙයින් වසර 2කට වැඩි කාලයක් සේවය කර තිබිය යුතු ය. (සහතික මගින් සනාථ කළ යුතු ය.)

*බඳවා ගැනීමේ ක්‍රමය.-* ව්‍යුහගත සම්මුඛ පරීක්ෂණයක ප්‍රතිඵල මත සුදුසුකම් ලත් අයදුම්කරුවන් බඳවා ගැනේ. දැනටමත් සභාවේ සේවය කරන අනියම්/ආදේශක/තාවකාලික සේවකයන් සඳහා ද ස්ථිර සේවයේ නියුතු PL 1 වැටුප් ක්‍රමයට අදාළ තනතුරු දරන අය සඳහා ද වැඩි සැලකිල්ලක් දක්වනු ලැබේ.

05. *පොදු කොන්දේසි :*

1. අයදුම්පත් භාරගන්නා අවසාන දිනට වයස අවුරුදු 18ට නොඅඩු සහ 45ට නොවැඩි විය යුතු ය.
2. අයදුම්කරුවන් පරම්පරාවෙන් හෝ ලියාපදිංචිවීමෙන් ශ්‍රී ලාංකිකයෙකු විය යුතු ය.
3. විශිෂ්ට චරිතයකින් හා මනා ශරීර සෞඛ්‍ය තත්ත්වයකින් යුක්ත විය යුතු ය.
4. දණ්ඩ නීති සංග්‍රහය යටතේ උසාවියකින් වරදකරුවෙකු වී දඬුවම් ලැබූවකු නොවිය යුතුය.
5. වාරියපොල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ වසර 03ක පදිංචිය, වසමේ ග්‍රාම නිලධාරි සහතිකය, ප්‍රාදේශීය ලේකම් විසින් සහතික කර සනාථ කළ යුතුය.
6. අයදුම්පත් කැඳවීමෙන් හෝ කැඳවන අතරතුර කාලසීමාවේ දී හෝ මෙම බඳවාගැනීම් ප්‍රමාද කිරීමට හෝ මෙම නිවේදනය අවලංගු කිරීමට හෝ සංශෝධනය කිරීමේ බලය වාරියපොල ප්‍රාදේශීය සභාවේ ලේකම් සතුවේ.

06. ප්‍රාදේශීය සභාවේ ස්ථිර සේවයේ නියුතු අයෙක් හෝ මෙම බඳවා ගැනීම් පටිපාටිය වයඹ ආණ්ඩුකාරතුමන් අනුමත කරන දින වන විට අනියම්/ආදේශක/තාවකාලික සේවයේ යෙදී සිටි අයෙකුට නම් වයස් සීමාව බලනොපාන අතර, ඔහු අයදුම්පත් භාරගන්නා අවසාන දිනට පූර්වාසන්න වසර 05 තුළ අවවාද කිරීමක් හැර දඬුවම් ලබා නොතිබිය යුතු අතර, එකී පූර්වාසන්න වසර 05 තුළ සියලු වැටුප් වර්ධක උපයාගෙන තිබිය යුතුය.

07. *අයදුම්පත් එවිය යුතු පිළිවෙල.-* සියලුම අයදුම්කරුවන් මෙහි පහතින් ඇති ආදර්ශ අයදුම්පත්‍රය අනුව පිළියෙල කරගත් අයදුම්පත් 2010.06.30 දිනට පෙර ලැබෙන සේ ලේකම්, ප්‍රාදේශීය සභාව, වාරියපොල යන ලිපිනයට ලියාපදිංචි තැපෑලෙන් එවිය යුතුය. අයදුම්පත් බහාලන කවරයේ වම්පස ඉහළ කෙළවරේ රියදුරු/නල ළිං පොම්ප කාර්මික තනතුර සඳහා අයදුම්පත යනුවෙන් සඳහන් කළ යුතුය.

අයදුම්පත්‍රය සමග පහත සඳහන් සහතිකවල අනුපිටපත් ඇමිණිය යුතුය :-

1. උප්පැන්න සහතිකය ;
2. අධ්‍යාපන සහතික ;
3. ශිල්පීය නිපුණතා/ප්‍රවීණතා හා පළපුරුද්ද පිළිබඳ සහතිකය (රියදුරු බලපත්‍රය) ;
4. හැඳුනුම්පත් පිටපතක් ;
5. ග්‍රාම නිලධාරී සහතිකය;
6. රියදුරකු වශයෙන් වසර 3කට වැඩි පළපුරුද්ද සම්බන්ධව සේවා සහතිකය.

වයි. එම්. සේනානායක,
ලේකම්,
ප්‍රාදේශීය සභාව-වාරියපොල.

2010 මැයි මස 24 වැනි දින,
වාරියපොල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

**ආදර්ශ අයදුම්පත්‍රය**

**වාරියපොල ප්‍රාදේශීය සභාවේ ............................................... *තනතුර සඳහා වූ අයදුම්පත්‍රය***

01. (අ) මුලකුරු සමඟ නම :——————.
(ආ) මුලකුරුවලින් හැඳින්වෙන නම් :——————.

02. පෞද්ගලික ලිපිනය :——————.

03. උපන් දිනය : අවුරුද්ද :——————.මාසය :——————.දිනය :——————.
(අ) ..................................... දිනට වයස ඃ අවුරුදු :——————.මාස :——————.දින :——————.

04. ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය :——————.

05. ඔබ ශ්‍රී ලාංකික පුරවැසියෙක්ද ? එසේ නම් පරම්පරාවෙන් ද? ලියාපදිංචි වීමෙන් ද? :——————.

06. ස්ත්‍රී/පුරුෂ භාවය :——————.

07. විවාහක/අවිවාහක බව :——————.

08. සමත්ව ඇති ඉහළම විභාගය :——————.

09. ශිල්පීය නිපුණතා :——————.

10. වෘත්තීය සුදුසුකම් :——————.

11. ඔබට උසාවියකින් දඬුවම් පවරා තිබේද ? :——————.

12. එසේනම් දඬුවම් ස්වභාවය :——————.

13. දැනට ප්‍රාදේශීය සභාවේ සේවයේ යෙදී සිටින්නේ නම් ඒ පිළිබඳ විස්තර :——————.

මෙම ඉල්ලුම්පත්‍රයෙහි මා විසින් සපයන ලද තොරතුරු සත්‍යවූත්, නිවැරදිවූත් ඒවා බව මෙයින් සහතික කරමි. මෙහි ඇතුළත් තොරතුරු අසත්‍ය හෝ වැරදි බව මා මෙම තනතුරට තෝරා ගැනීමට පෙර අනාවරණය වුවහොත්, මා නුසුදුස්සෙකු බවට පත්වන බවත්, තෝරා ගැනීමෙන් පසු දැනගතහොත් කිසිදු වන්දියක් නොගෙවා සේවයෙන් පහ කිරීමට යටත් වන බවත් මම දනිමි.

——————,
අයදුම්කරුගේ අත්සන.

දිනය :——————.

06-253

# පළාත් පාලන නිවේදන

## හබරාදූව ප්‍රාදේශීය සභාව

1989 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාවත හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මාවතට අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධතාවයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළවූ දිනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඒ. බන්දුපාල අබේකෝන්,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| පාරේ නම | - | නාකන්ද ඊරියගහ පාර |
| ආරම්භය | - | අහංගම නාකන්ද පාර |
| අවසානය | - | නිවාසවලින් |
| පාරේ දිග | - | මීටර් 466 |
| පාරේ පළල | - | මීටර් 3.63 |
| ග්‍රාම සේවා වසම | - | 159 නාකන්ද |

*වම්පස :*

| | | | |
|---|---|---|---|
| 01. | දිගරුද්ද රාලහාමි | - | වෙල |
| 02. | ඒ. වී. ලීලාවතී මිය | - | ඊරියගහ හේනවත්ත |
| 03. | ඒ. වී. ඩී. බන්දුල රණවීර මහතා | - | කුඹුර |
| 04. | පුංචි ඇලහේනදෙනිය කුඹුර | - | |

*දකුණුපස :*

| | | | |
|---|---|---|---|
| 01. | ගාමිණී ජයතිලක මයා. | - | කුරුඳුගහ ඕවිට වෙල |
| 02. | එම්. එන්. එල්. විජේසිංහ මයා. | - | ඊරියගහ හේනවත්ත |
| 03. | ඒ. වී. කරුණාදාස මයා. | - | ඊරියගහ හේනවත්ත |
| 04. | එල්. ජී. චන්ද්‍රසේන මයා. | - | මහහේනවත්ත (රජයෙන් දෙන ලද ඉඩම්) |
| 05. | බී. ජී. සමරසේන මයා. | - | මහහේනවත්ත (රජයෙන් දෙන ලද ඉඩම්) |
| 06. | එම්. එම්. විජේදාස මයා. | - | මහහේනවත්ත (රජයෙන් දෙන ලද ඉඩම්) |

06-315/2

## හබරාදූව ප්‍රාදේශීය සභාව

1989 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(1) (ආ) වැනි වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම.

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24 වැනි වගන්තිය ප්‍රකාර දකුණු පළාත් සභාවේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, හබරාදූව ප්‍රාදේශීය සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මාවත හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මාවතක් වශයෙන් ප්‍රකාශයට පත්කරනු ලබන බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

මේ පිළිබඳව ප්‍රදේශයේ පොදු ජනතාව විසින් හෝ මාවතට අදාළ ඉඩම් අයිතිකරුවන් ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් හෝ යම් විරුද්ධතාවයක් පළකරනු ලබන්නේ නම් මෙම නිවේදනය ගැසට් පත්‍රයේ පළ වූ දිනයේ සිට එක් මසක් ඇතුළත තමන්ගේ අයිතිය ඔප්පු කිරීම සඳහා 1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 24(2) වැනි වගන්තිය ප්‍රකාර ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

මෙම කාලසීමාව තුළ යම් විරුද්ධතාවයක් ඉදිරිපත් නොවුවහොත් උපලේඛනයේ සඳහන් මාර්ගය හබරාදූව ප්‍රාදේශීය සභාව සතු මාර්ගයක් වශයෙන් පිළිගෙන පාලනය කරනු ලබන බැව් පොදු ජනතාවගේ දැනගැනීම සඳහා මෙයින් ප්‍රකාශයට පත් කරමි.

ඒ. බන්දුපාල අබේකෝන්,
සභාපති,
හබරාදූව ප්‍රාදේශීය සභාව.

2010 මැයි මස 31 වැනි දින,
හබරාදූව ප්‍රාදේශීය සභා ප්‍රධාන කාර්යාලයේ දී ය.

### උපලේඛනය

| | | |
|---|---|---|
| පාරේ නම | - | අහංගම දිගරුද්ද, වේල්ලගොඩවත්ත පාර |
| ආරම්භය | - | මුනිදාස මාවත |
| අවසානය | - | නිවාසවලින් |
| පාරේ දිග | - | මීටර් 212 |
| පාරේ පළල | - | මීටර් 3.63 |
| ග්‍රාම සේවා වසම | - | 157 අහංගම මධ්‍යම |

*වම්පස :*

| | | | |
|---|---|---|---|
| 01. | නවරත්න පිටිය පන්සල | | |
| 02. | එන්. ජී. චන්ද්‍රසේන පියසිංහ මහතා | - | ජම්බුගහවත්ත ඉඩම |
| 03. | එච්. ජී. සමරසිරි මයා. | - | වේල්ලගොඩවත්ත |
| 04. | කේ. අයිරින් මිය. | - | වේල්ලගොඩවත්ත |

*දකුණුපස :*

| | | | |
|---|---|---|---|
| 01. | ඩබ්ලිව්. ප්‍රේමසිංහ මයා. | - | දංගහලියද්ද කුඹුර |
| 02. | චන්ද්‍රන අබේසුන්දර මයා. | - | ගොඩගේ කුඹුර |
| 03. | ඒ. වී. නිමල් රංජිත් මයා.<br>ඒ. වී. ස්වර්ණලතා මිය. | - | දිවෙල් කුඹුර |
| 04. | ටී. රංජනී මිය.<br>ටී. ඉන්ද්‍රානි මිය. | - | කලව්ටවත්ත |

06-315/1

## අලව්ව ප්‍රාදේශීය සභාව - නාරම්මල

### දියුණු ගම් ප්‍රදේශයක් වශයෙන් ප්‍රකාශයට පත් කිරීමේ සහා යෝජනාව සහ එය අනුමත කිරීම ප්‍රකාශයට පත් කිරීම

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උප වගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභාව විසින් 2009 වර්ෂයේ අගෝස්තු මස 25 වැනි දින පවත්වන ලද සභා රැස්වීමේ දී තීරණ අංක 04-3 යටතේ සභා සම්මත කරන ලද පහත සඳහන් යෝජනාවට එකී පනතේ ඉහත කී උපවගන්තියෙන් පළාත් පාලන කොමසාරිස්වරුන් වෙත ලැබී ඇති බලතල යටතේ වයඹ පළාතේ පළාත් පාලන කොමසාරිස් ඩබ්. එම්. එම්. බී. වීරසේකර වන ම විසින් අනුමැතිය දෙනු ලැබ ඇති බව මහජනතාව වෙත මෙයින් නිවේදන කරනු ලැබේ.

ඩබ්. එම්. එම්. බී. වීරසේකර,
පළාත් පාලන කොමසාරිස් (වයඹ).

2010 මැයි මස 31 වැනි දින,
කුරුණෑගල පළාත් පාලන කොමසාරිස් කාර්යාලයේ දී ය.

*යෝජනාව*

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 134 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තියෙන් ප්‍රාදේශීය සභාවට ලැබී ඇති බලතල ප්‍රකාරව අලව්ව ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය ඇතුළත පිහිටි පහත අංක 01 උපලේඛනයේ විස්තර කෙරෙන ප්‍රදේශ දියුණු කළ ප්‍රදේශ වශයෙන් පිළිගත යුතු බවත්,

එම පිළිගැනීමේ යෝජනා සම්මුතියට වයඹ පළාතේ පළාත්පාලන කොමසාරිස් අනුමතිය ලබාගැනීමට ක්‍රියා කළ යුතු බවත්, අලව්ව ප්‍රාදේශීය සභාවට යෝජනා කරන්නීය.

06-361

---

## කැළණිය ප්‍රාදේශීය සභාව

### විනෝද බද්ද

කැළණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පවත්වනු ලබන විනෝද දර්ශනයක් වෙනුවෙන් එම දර්ශනය සඳහා නිකුත් කරනු ලබන ප්‍රවේශ පත්‍රවල වටිනාකමින් 20%ක විනෝද බද්දක් බස්නාහිර පළාත් සභාවේ ගරු පළාත් පාලන විෂය භාර අමාත්‍යතුමාගේ අනුමැතිය ලැබීමෙන් පසු පනවා අයකිරීමට 2009 දෙසැම්බර් මස 29 වැනි දින පැවති කැළණිය ප්‍රාදේශීය සභාවේ මාසික මහ සභා රැස්වීමේ දී සභා සම්මත වූ බව මෙයින් නිවේදනය කරමි.

බී. ප්‍රසන්න රණවීර,
සභාපති,
කැළණිය ප්‍රාදේශීය සභාව.

06-444

---

## ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව

### ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරිය වන මහ නගර සභා සභා ආඥාපනතේ 37(1) "අ" වගන්තිය යටතේ කරනු ලබන දැන්වීම

ශ්‍රී ලංකා නීති ප්‍රඥප්තියේ 252 අධිකාරිය වන මහ නගර සභා ආඥාපනතේ 37(1) "ආ" වගන්තිය ප්‍රකාර, බස්නාහිර පළාතේ, කොළඹ දිස්ත්‍රික්කයේ ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහා නගර සභාව විසින් මෙහි පහත උපලේඛනයේ දක්වා ඇති මංමාවත් ද, ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව සතු මංමාවත් වශයෙන් ප්‍රකාශයට පත් කරනු ලබන බවට මෙයින් නිවේදනය කරනු ලැබේ.

දැනට මහ නගර සභාව විසින් මැන සලකුණු යොදා ඇති මෙම මංමාවත් සම්බන්ධයෙන් අදාළ ඉඩම්වල අයිතිකරු ලෙස හිමිකම් පාන පාර්ශ්වයන් විසින් විරුද්ධතාවයක් පළ කරන්නේ නම් මේ නිවේදනයේ සිට එක් මසක් ඇතුළත එකී විරෝධතාවයන් ලිඛිතව ඉදිරිපත් කිරීමට ක්‍රියා කරන ලෙස මෙයින් දැනුම් දෙනු ලැබේ.

ශාන්තා පී. ලියනගේ,
නාගරික කොමසාරිස්,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභාව.

2010 මැයි මස 12 වැනි දින,
ශ්‍රී ජයවර්ධනපුර කෝට්ටේ මහ නගර සභා කාර්යාලයේ දී ය.

| *අනු අංකය* | *පාරේ නම* | *මායිම් සීමාවේ සිට දක්වා* | *දිග අඩි* | *පළල අඩි* |
|---|---|---|---|---|
| 01 | රාජගිරිය, නාවල පාර, කුරුඳුවත්ත පල්ලිය පටුමග ව. අ. 113/10,113/101/1, 113/11,113/12ඒ,113/12බී නිවස සඳහා ප්‍රවේශ සැපයෙන අතුරු පාර | ව. අං. 113/10 සිට ව. අ. 113/12බී දක්වා | 160 | 12 |
| 02 | රාජගිරිය, රාජගිරිය උද්‍යානයේ ව. අ. 13/බී,615/3/3, 615/7,615/9,615/10,615/26 615/33,1366 1/1 ට ප්‍රවේශ ලබන මාර්ගය | ව. අ. 13/බී සිට ව. අ. 1366 1/1 දක්වා | 350 | 20 |
| 03 | කෝට්ටේ අලකේශ්වර පාර කෙළවර ව. අ. 185 සිට අංක 185/20දක්වා අතුරු මාර්ගය | ව. අ. 185 සිට ව. අ. 185/20 දක්වා | 416 | 15-7" |

06-256

# විවිධ දැන්වීම්

## තංගල්ල ප්‍රාදේශීය සභාව

වාර්ෂික බලපත්‍ර ගාස්තු පැනවීම - 2010

**අන්තරාදායී හා අප්‍රසන්න ව්‍යාපාර**

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ 149 වැනි වගන්තිය ප්‍රකාරව, තංගල්ල ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ පිහිටි පහත සඳහන් උපලේඛනයෙන් විස්තර කර ඇති පරිදි අන්තරාදායී හා අප්‍රසන්න වෙළඳ ව්‍යාපාරික ස්ථාන සඳහා එකී පරිශ්‍රයේ හෝ ස්ථානයේ වාර්ෂික වටිනාකම මත පදනම් වූ බලපත්‍ර ගාස්තුවක් 2010 වර්ෂය සඳහා පනවා අයකිරීමට තංගල්ල ප්‍රාදේශීය සභාව 2010 අප්‍රේල් මස 30 වැනි දින පැවති ප්‍රාදේශීය සභා රැස්වීමේ අංක 3:1 යටතේ තීරණය කරන ලද බව මෙයින් දැනුම් දෙමි. මෙම බලපත්‍ර ගාස්තුව 2010 ජුනි 30 වැනි දිනට හෝ ඊට පෙර ප්‍රාදේශීය සභාවට ගෙවා අදාළ බලපත්‍රය ලබාගත යුතු බවත් මෙයින් දැනුම් දෙමි.

ලාලිත ආර්. වනිගසේකර,
සභාපති,
තංගල්ල ප්‍රාදේශීය සභාව.

2010 ක් වූ මැයි මස 03 වැනි දින,
නෙටොල්පිටිය,
තංගල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ දී ය.

*අන්තරාදායී හා අප්‍රසන්න ව්‍යාපාර පිළිබඳ උපලේඛනය*

| *අනු අංකය* | *I තීරුව වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය* | *II තීරුව වාර්ෂික වටිනාකම* | | |
|---|---|---|---|---|
| | | *රු. 750 ට නොවැඩි* | *රු. 750 සිට රු. 1,500* | *රු. 1,501 ට වැඩි* |
| | | *රු. ශත* | *රු. ශත* | *රු. ශත* |
| 01. | බේකරියක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 02. | බත් කඩයක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 03. | තේ හෝ කෝපි කඩයක් පවත්වාගෙන යාම | 150 0 | 250 0 | 450 0 |
| 04. | භෝජන ශාලාවක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 05. | නේවාසික පහසුකම් සහිත හෝටලයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 06. | නේවාසික පහසුකම් රහිත හෝටලයක් පවත්වාගෙන යාම | 450 0 | 700 0 | 1,000 0 |
| 07. | ලැගුම් හලක් හෝ නවාතැන් පොළක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 900 0 |
| 08. | අයිස්ක්‍රීම් විකුණන ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 |
| 09. | සිරප් හෝ පළතුරු බීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 |
| 10. | බීම පැකට් නිෂ්පාදනය කිරීම | 250 0 | 350 0 | 450 0 |
| 11. | රසකැවිලි නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 |
| 12. | බයිට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 |
| 13. | යෝගට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 |
| 14. | කුළුබඩු හෝ ආහාර ද්‍රව්‍ය, වෙළඳ සැලක් පවත්වාගෙන යාම | 250 0 | 450 0 | 700 0 |
| 15. | කුළුබඩු හෝ ආහාර ද්‍රව්‍ය, වෙළඳ සැලක් පවත්වාගෙන යාම (තොග සමග) | 450 0 | 700 0 | 1,000 0 |
| 16. | තුනපහ කුඩුකර පැකට් කර අලෙවි කිරීමේ ස්ථානයක් පවත්වාගෙනයාම | 350 0 | 500 0 | 750 0 |
| 17. | ඇඹරුම්හලක් පවත්වාගෙන යාම | 350 0 | 450 0 | 750 0 |
| 18. | බිම්මල් ව්‍යාපාරයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 600 0 |
| 19. | සංචාරක බංගලාවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 20. | ආගන්තුක නිවාසක් පවත්වාගෙන යාම | 250 0 | 450 0 | 700 0 |
| 21. | සංචාරකයින් සඳහා හෝටලයක් පවත්වාගෙන යාම (සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි නොවූ) | 500 0 | 750 0 | 1,000 0 |
| 22. | සංචාරකයින් සඳහා හෝටලයක් පවත්වාගෙන යාම (සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි වී ඇති) | | සටහනෙහි දක්වා ඇත | |
| 23. | අයිස්ක්‍රීම් හා බීම පැකට් නිෂ්පාදනය කිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 |
| 24. | සංචාරක වෙළඳාම් බලපත්‍රය | 250 0 | 450 0 | 700 0 |
| 25. | පිසින ලද මාළු ආශ්‍රිත ආහාර වෙළඳාම | 250 0 | 450 0 | 700 0 |
| 26. | දෙනුන් පහකට නොඅඩු ගව පට්ටියක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 700 0 |
| 27. | මාළු විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 450 0 | 600 0 | 900 0 |
| 28. | ගවමස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 29. | ගෝ ඝාතක මඩුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 30. | ගවමස් හැර වෙනත් මස් විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 31. | කුකුළු,කිකිලියන් 25 ට වැඩි එහෙත් 100 ට අඩු කුකුළු කොටුවක් පවත්වාගෙන යාම | 250 0 | 750 0 | 900 0 |

| I අනු අංකය | තීරුව වෙළඳාමේ හෝ ව්‍යාපාරයේ ස්වභාවය | II තීරුව වාර්ෂික වටිනාකම රු. 750 ට නොවැඩි | රු. 750 සිට රු. 1,500 | රු. 1,501 ට වැඩි |
|---|---|---|---|---|
| | | රු. ශත | රු. ශත | රු. ශත |
| 32. | කුකුළු,කිකිළියන් 100ක් හෝ ඊට වැඩි කුකුළු කොටුවක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 33. | කුකුළු පැටව් විකිණීම සඳහා ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 450 0 | 700 0 |
| 34. | කරවල හෝ උම්බලකඩ වියලීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 450 0 |
| 35. | නගර සීමාව තුළ සංචාරක මාළු වෙළඳාම | 300 0 | 450 0 | 700 0 |
| 36. | ශීත කළ මස් හෝ මාළු වෙළඳාම් කරන ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 450 0 | 700 0 |
| 37. | මාළු ජාඩි දැමීම හෝ වේලීම හෝ ලුණු දැමීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 450 0 | 600 0 |
| 38. | කරවල හෝ උම්බලකඩ හෝ ජාඩි ගබඩා කර තැබීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 250 0 | 450 0 | 600 0 |
| 39. | පෞද්ගලික කඩපොලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 40. | වී මෝලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 41. | බාබර් සාප්පුවක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |
| 42. | කළුගල්වලක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 43. | කළුගල් ඇඹරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 44. | ලොන්ඩ්‍රියක් පවත්වාගෙන යාම | 250 0 | 350 0 | 500 0 |
| 45. | හුණු ගබඩා කර තැබීමේ හෝ විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 600 0 |
| 46. | වෙළඳාම සඳහා කොන්ක්‍රීට් ගල් නිපදවීම (යාන්ත්‍රික නොවන) | 250 0 | 350 0 | 450 0 |
| 47. | වෙළඳාම සඳහා කොන්ක්‍රීට් ගල් නිපදවීම (යාන්ත්‍රික) | 500 0 | 700 0 | 900 0 |
| 48. | අයිස් නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 49. | රබර් මිශ්‍ර කොහු මෙට්ට නිපදවීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 500 0 | 750 0 | 1,000 0 |
| 50. | පළතුරු, මාළු හෝ වෙනත් ආහාර ද්‍රව්‍ය ඇසිරීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 750 0 |
| 51. | කෘෂි රසායන ද්‍රව්‍ය විකිණීමේ ස්ථානයක් පවත්වාගෙන යාම | 300 0 | 500 0 | 700 0 |

*සටහන :*

*සැ.යු.* - 1968 අංක 14 දරන සංචාරක සංවර්ධන පනතේ කාර්ය සඳහා ශ්‍රී ලංකා සංචාරක මණ්ඩලයේ ලියාපදිංචි කරනු ලැබ ඇත්තා වූ ද, අනුමත කර හෝ පිළිගත්තා වූ ද හෝටලයක්, ආපන ශාලාවක් හෝ නවාතැන්පොළක් වන විට ගාස්තුව අයකළ යුතු වර්ෂයට පෙර වර්ෂය සඳහා එම හෝටලයේ, ආපන ශාලාවේ හෝ නවාතැන් පොලේ ලැබීම්වලින් 1% ක් උපරිමය විය යුතුය. ඒ හෝටලය, ආපන ශාලාව හෝ නවාතැන් පොළ ක්‍රියාත්මක වන පළමු අවුරුද්ද වන අවස්ථාවක ඒ ගාස්තුව ඒ ස්ථානයේ වාර්ෂික වටිනාකම මත නිශ්චය කර අය කරනු ලැබිය යුතුය.

06-314

---

## කැළණිය ප්‍රාදේශීය සභාව

### ප්‍රචාරක දැන්වීම දෘශ්‍ය පරිසරය 2010 වර්ෂය

1987 අංක 15 දරන ප්‍රාදේශීය සභා පනතේ අංක 122 හා 126 වැනි වගන්ති අනුව 1988.08.23 දින අංක IV"අ" කොටස පළාත් පාලන අතිවිශෙෂ ගැසට් පත්‍රය මගින් ප්‍රකාශයට පත්කර ඇති අංක 675,1991.08.09 දින ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කිරීමෙන් කැළණිය ප්‍රාදේශීය සභාව මගින් පිළිගැනීමට තීරණය කරන ලද පොදු අතුරු ව්‍යවස්ථා වල අංක 39 ඡේදය යටතේ කැළණිය ප්‍රාදේශීය සභාවේ බල සීමාව තුළ ප්‍රචාරක දැන්වීම් ඉදිකිරීම් හා ප්‍රදර්ශනය කිරීම් වෙනුවෙන් පහත සඳහන් පරිදි ගාස්තු 2010.01.01 දින සිට අයකිරීමට 2009.11.30 දින පැවති මහ සභා රැස්වීමේ දී (ඉ) යෝජනා අංක 01,iii බී යටතේ සභා සම්මත වී ඇති බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

*උපලේඛනය*

| | රු. ශත |
|---|---|
| කැළණිය ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුළ ප්‍රදර්ශනය කරන ලද ප්‍රචාරක දැන්වීම් පුවරුවක් සඳහා (වර්ෂයක කාලයක් සඳහා) වර්ග අඩියකට | 400 0 |
| බැනර් සඳහා (මසක කාල සීමාවකට) (ඉටි රෙදි හෝ රෙදි බැනර්) | 50 0 |

බී. ප්‍රසන්න රණවීර,
සභාපති,
කැළණිය ප්‍රාදේශීය සභාව.

06-445

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.